# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2025.12.15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2025 නොවැම්බර්

**2025 නොවැම්බර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.**

**නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2025 නොවැම්බර් මාසයේ දී දර්ශකාංක 55.5ක අගයක් වාර්තා කළේය.** මෙමගින් පසුගිය මාසයට සාපේක්ෂව නිෂ්පාදන කටයුතුවල වර්ධනයක් පෙන්නුම් කරන අතර, ඒ සඳහා සියලු උප දර්ශක ධනාත්මකව දායක වී ඇත.


නව ඇණවුම්වල වර්ධනය සඳහා ආහාර හා පාන වර්ග, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල ක්‍රියාකාරකම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, පෙර මාසයේ පැවති නිෂ්පාදන මට්ටමම පිළිබිඹු කරමින් නිෂ්පාදන උප දර්ශකය කඩඉම් මට්ටමේ පැවතුණි. ඊට අමතරව, නව ඇණවුම් සහ නිෂ්පාදන වල දක්නට ලැබුණු වර්ධනයට අනුකූලව, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් පසුගිය මාසයට සාපේක්ෂව වැඩිවීමක් වාර්තා කළේය. මේ අතර, නිශ්පාදන යෙදවුම් සඳහා තවදුරටත් ඇති ඉල්ලුම පිළිබිඹු කරමින්, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය නොවැම්බර් මාසයේ දී ද ඉහළ මට්ටමක පැවතුණි.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

55.5

2025 නොවැම්බර්

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **61.0** | **55.5** | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නව ඇණවුම් | 64.0 | 58.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 62.5 | 50.0 | - | ඉහළ යෑමක සිට කඩඉම් මට්ටමට පැමිණීමක් |
| සේවා නියුක්තිය | 56.0 | 55.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 62.5 | 57.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 58.0 | 57.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මෑත කාලීන අයහපත් කාලගුණික තත්ත්වයන් මධ්‍යයේ වුවද, ප්‍රධාන වශයෙන් උත්සව සමයේ ඉල්ලුම අපේක්ෂා හේතුවෙන්, ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන කටයුතුවල අපේක්ෂා ධනාත්මකව පවතී.

**ගෝලීය ප්‍රවණතා**
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| එක්සත් ජනපදය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | කඩඉම් මට්ටමේ සිට පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 දෙසැම්බර් 15 වන දිනට (PMI Releases (spglobal.com))*

[1] *එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සේවා ක්‍රියාකාරකම්වල මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරමින්, 2025 නොවැම්බර් මාසයේ දී දර්ශකාංක 50.5ක අගයක් වාර්තා කළේය.**

2025 නොවැම්බර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් මන්දගාමී වර්ධනයක් වාර්තා කළ අතර, ඒ සඳහා මාසය අවසානයේ අත්විඳින ලද අහිතකර කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම ද හේතු විය. නවාතැන් හා ආහාරපාන ආශ්‍රිත සේවා අංශයෙහි වාර්තා වූ වර්ධනය මෙම ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, ණය දීම් ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය සේවා හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් ද නොවැම්බර් මාසය තුළ දී ඉහළ යාම  මෙම සමස්ත වර්ධනයට හේතු විය.

ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා සඳහා වූ ඉහළ ඉල්ලුම සහ තොග සහ සිල්ලර වෙළඳාම යන අංශවල  සිදු වූ වර්ධනයත් සමඟ 2025 නොවැම්බර් මාසයේ දී නව ව්‍යාපාරවල ඉහළ යෑමක් දක්නට ලැබුණි.

දැනට පවත්නා සෘතුමය මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා සමාගම් කිහිපයක සිදු වූ නව බඳවා ගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය 2025 නොවැම්බර් මාසයේ දී අඛණ්ඩව ඉහළ ගියේය. නිම කිරීමට නියමිත කාර්යයන් මාස තුනක අඛණ්ඩ පහත වැටීමකින් පසුව ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **66.0** | **50.5** | - | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| **නව ව්‍යාපාර** | 61.5 | 53.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **සේවා නියුක්තිය** | 52.5 | 55.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **නිම කිරීමට නියමිත කාර්යයන්** | 47.8 | 51.1 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| **අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්** | 84.2 | 63.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි කාර්තුව සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා අපේක්ෂාවන් අඛණ්ඩව අඩු වේගයකින් වැඩිදියුණු විය. අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් පාරිභෝගික ඉල්ලුමට ඇති වන බාධා පිළිබඳව ඇතැම් ව්‍යාපාර අදහස් දැක්වීය. කෙසේ වෙතත්, සාපේක්ෂව හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් සහ උත්සව සමයේ ඉල්ලුම වැඩිවනු ඇතැයි අපේක්ෂා කිරීම ව්‍යාපාරික අපේක්ෂාවන්ට සහායක් විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**50.5**

**2025 නොවැම්බර්**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| **ගෝලීය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **ඉන්දියාව** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **චීනය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් ජනපදය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් රාජධානිය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **යුරෝපා කලාපය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 දෙසැම්බර් 15 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ හරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.